# වඳුරු පැංචා



කේ.එම්. ලිනේජා ලක්නාරා අනුත්මී කරුණාතිලක

# *වදුරු පැංචා*

කතෘ :- කේ.එම්. ලිනේජා ලක්නාරා අනුත්මී කරුණාතිලක

**කෘතිය පල කරන දිනය :- 2023.11.15**

**INSB** අංකය :- 978-624-208-001-7

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණයකරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023 . 10 . 20

# පිදුම

ආදරණීය ........

ගුරුමෑණියන්ටත්....

යහළු යෙහෙළියන්ටත් .....


ආදරයෙන් පුදමි! .......

## ස්තූතිය

මෙම පොත සකස් කිරීමට
මා හට උදව් කල
මගේ ආදරණීය...
සමන්මලී ගුරුතුමියටත්
යහළු යෙහෙළියන්ටත්
අනෙක් සියළු දෙනාටමත්
මගේ ස්තූතිය!

ලිනේජා ලක්නාරා

එකමත් එක කැලෑවක වඳුරු පවුලක් ජීවත් වුණා. මේ පවුලේ වඳුරු පැංචාත් එක්ක එයාගේ අම්මයි, තාත්තයි ජීවත් වුණා. එයාලා හරිම සතුටින් සමගියෙන් තමයි කැලයේ ජීවත් වුණේ. මේ වඳුරු පැංචාට අම්මයි තාත්තයි ගොඩාක් ආදරෙයි.



එක දවසක් මේ වඳුරු පැංචා "අම්මේ මම කැලයට ගිහින් පොඩ්ඩක් සෙල්ලම් කරලා එන්නද?" කියලා අම්මාගෙන් ඇසුවා. "මේ කැලෑවේ තනියම යන්න එපා පුතා, ඔයාට තාම තනියම යන්න බෑනේ....." කියලා අම්මා කිවුවා. ඒත් මේ වඳුරු පැංචා අම්මාට ගොඩාක් කරදර කළා. " පුතා යන්න, ගිහින් එන්න, හැබැයි පරිස්සමින් .... සෙල්ලම් කරලා රෑ වෙන්න කලින් ගෙදර එන්න " කියලා අම්මා කිවුවා.



වඳුරු පැංචා හෙමින් හෙමින් ටික දුරක් ගියා. ඒ යන විට පැංචාට කෙඳිරිලි හඬක් ඇසුණා. ඊට පස්සේ එයා සෝදිසියෙන් වටපිට බැලුවා. “අනේ! මේ මුව පැටියෙක් උගුලකට අසු වෙලානේ... ඉන්න, බය වෙන්න එපා, මං ඔයාව බේරගන්නම්” වඳුරු පැංචා කීවා.



වඳුරු පැංචා ඉක්මනින් ම මුව පැටියාව උගුලෙන් බේරා ගත්තා. "ඔයාට ගොඩාක් තුවාල වෙලා. තුවාල වලට බෙහෙත් කරන්න අපි අපේ ගෙදර යමු " කියලා වඳුරු පැංචා කීවා.



වඳුරු පැංචා මුව පැටියාව එයාගේ ගෙදරට එක්ක ගියා. ඒ දුටු වඳුරු පැංචාගේ අම්මා බිය වී දුවගෙන ඉදිරියට ආවා. "ඇයි පුතේ, මොකද වුනේ ? "කියා අම්මා ඇසුවා.




වඳුරු පැංචා, අම්මාට සියල්ල විස්තර කළා. "ඉතින් අම්මේ, මම මුව පැටියාව බේර ගත්තා. දැන් අපි මුව පැටියාගේ තුවාලවලට බෙහෙත් කරමු? " වඳුරු පැංචා කීවා.




ඊට පස්සේ පැංචාගේ තාත්තා අම්මා එකතු වී මුව පැටියාට බෙහෙත් කලා. ටික වේලාවකට පසු " මගේ අම්මා මං එනතුරු බලාගෙන ඇති. දැන් මම මගේ අම්මා ළඟට යන්න ඕනෑ..." යි මුව පැටියා කීවා.

" ඔයාට තනියම යන්න පුළුවන්ද? " වඳුරු පැංචා ඇසුවා.

" ඔව් මට දැන් තනියම යන්න පුළුවන්, ඔයාලට ගොඩාක් ස්තූතියි. ඔයාලා හරිම කරුණාවන්ත අය. මම මගේ අම්මාට ඔයාලා ගැන කියන්නම්. මම යන්නම්. ගොඩාක් ස්තූතියි ". මුව පැටියා ඇස්වල කඳුළු පුරෝගෙන යන්න ගියා.



වඳුරු අම්මාට තමන්ගේ පුතා ගැන ගොඩාක් ආඩම්බර හිතුණා. " අන් අයට කරදරයක් වුනාම උදව් කරන එක යහපත් ගුණාංගයක්, මගේ පුතා ජීවිතයක් බේරා ගත්තා. මට මගේ පුතා ගැන හරි ම ආඩම්බරයි " වඳුරු අම්මා එසේ කියමින් වඳුරු පැංචාව තුරුළු කර ගත්තා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා ප්‍රංචි ගතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනිම් නිර්මාණත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරණ කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියනෑ සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු !


මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ


2023 . 10 . 20